ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2514/25 – 2026 නොවැම්බර් මස 11 වැනි බදාදා – 2026.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වන විරෝධතාවයන් 2026 නොවැම්බර් මස 30 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
සභාපති,
සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ,
පඩිපාලක සභාව.

2026 ඔක්තෝබර් 29 වැනි දින,
කොළඹ 05.
‘‘ මෙහෙවර පියෙස ’’.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1990 පෙබරවාරි මස 28 වැනි දින අංක 599/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූද, අවසන්වරට 2022.01.07 වන දින අංක 2261/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද, තීරණ එම උපලේඛනයෙහි II කොටසේ II තිරය වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

II වැනි කොටස

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

I වැනි තීරය

සේවකයින්ගේ පංතිය

I ශ්‍රේණිය	ගබඩාකරුවන්, පොත්තබන්නන්. අයකැම්වරුන්, කළමණාකරුවන්, ලඝුලේඛකයින්, ඩිස්පැන්සරිවරුන්
II ශ්‍රේණිය	දුරකථන ක්‍රියාකරුවන්, ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, ලෙජර් ලිපිකරුවන්, ගිණුම් ලිපිකරුවන්, සහකාර අයකැම්වරුන්, පිරිවැය ලිපිකරුවන්, වේතන ලිපිකරුවන්, මුදල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, බිල් ලිපිකරුවන්
III ශ්‍රේණිය	බිල්පත් එකතු කරන්නන්, විකුණුම්කරුවෝ, විකුණුම්කාරියෝ, හරි වැරදි බලන්නන්
IV ශ්‍රේණිය	කම්කරුවන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, සාප්පු සේවකයින්, අසුරන්නන්. පණිවුඩකරුවන්, කවුන්ටර් සේවකයින්, ඕඩර්ලිවරුන්, බෑමේ සහ පැටවීමේ කම්කරුවන්, පොම්පකරුවන්, පාපැදිකරුවන්

***11* වැනි තීරය**

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

සේවක පංතිය

	සේවක පන්තිය			
සේවා වර්ෂය	**ශ්‍රේණිය 1** **රු. ශත**	**ශ්‍රේණිය II** **රු. ශත**	**ශ්‍රේණිය 111** **රු. ශත**	**ශ්‍රේණිය IV** **රු. ශත**
1 වන වසර	33305.00	32525.00	31752.00	31000.00
2 වන වසර	33580.00	32775.00	31977.00	31200.00
3 වන වසර	33855.00	33025.00	32202.00	31400.00
4 වන වසර	34130.00	33275.00	32427.00	31600.00
5 වන වසර	34405.00	33525.00	32652.00	31800.00
6 වන වසර	34680.00	33775.00	32877.00	
7 වන වසර	34955.00	34025.00	33102.00	
8 වන වසර	35230.00	34275.00	33327.00	
9 වන වසර	35505.00	34525.00	33552.00	
10 වන වසර	35780.00	34775.00	33777.00	

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.